# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2473/25 - 2026 ජනවාරි මස 30 වැනි සිකුරාදා - 2026.01.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**එල්. ඩී. බී. 3/2025**

**(129 වන අධිකාරය වූ) සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත**

(129 වන අධිකාරය වූ) සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 66 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝගය.

ආචාර්ය. අනිල් ජයන්ත ප්‍රනාන්දු,
කම්කරු අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

1974 මැයි 10 වැනි දින අංක 111 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගය මගින් සංශෝධිත, 1954 ඔක්තෝබර් මස 15 වැනි දින අංක 10724 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1954 සාප්පු සහ කර්යාලයීය සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) නියෝගවල 3 වන නියෝගය, එම නියෝගයේ "හෝ කාන්තා වැසිකිළි සේවිකාවක් වශයෙන් අවුරුදු දහඅටට එළඹ සිටින කවර ස්ත්‍රියක් වුව ද පෙරවරු හයට හෝ පස්වරු හයෙන් පසුව සේවයෙ හි යෙදවිය හැකි ය". යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

"කාන්තා සනීපාරක්ෂක සේවිකාවක් හෝ ආහාරපාන පිළිගන්වන සේවිකාවක් වශයෙන් අවුරුදු දහඅටට එළඹ සිටින කවර ස්ත්‍රියක් වුව ද පස්වරු හයට පසු හෝ පසුදා පෙරවරු හයට පෙර සේවයෙ හි යෙදවිය හැකි ය :

1A - G 46202 — 04 (2026/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එසේ වුව ද, මෙම නියෝගය යටතේ සේවයේ නියුක්ත කරවන ලද යම් ස්ත්‍රියකගේ සේවා මුරය පස්වරු හයත් පසුදා පෙරවරු හයත් අතර වේලාවක දී අවසන්වන අවස්ථාවක දී, එකී සේවා මුරය අවසන් වූ අවස්ථාවේ සිට පෙරවරු හය දක්වා එම ස්ත්‍රියට සුදුසු නවාතැනක් සැපයීම හෝ එම ස්ත්‍රියගේ සුපුරුදු වාසස්ථානය වෙත ප්‍රවාහන පහසුකම් සැපයීම ඇතුළුව එම ස්ත්‍රියගේ සෞඛ්‍යාරක්ෂාව සහ සුබසාධනය සම්බන්ධයෙන් සේවා යෝජකයා වගකිය යුතු වන්නේ ය."

EOG 01 - 0289

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.